www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Provincial Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 21 S

සිංහල භාෂාව හා සාහිත්‍යය - I කොටස | කාලය පැය දෙකයි

නම ..............................................

උපදෙස් :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

★ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට සමාන අර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) <u>වෘක්ෂලතා</u> පරිසරය අංලකාර කරයි.

(1) කඳුවැටි (2) ඇළ දොළ (3) ගස් වැල් (4) දිය දහරා

(2) ඇය <u>උඩඟු</u> කාන්තාවක් වූවාය.

(1) අහංකාර (2) නිහඬ (3) අවංක (4) කාරුණික

(3) <u>විකසිත</u> පුෂ්පයෝ සුවඳ විහිදුවති.

(1) පරවුණු (2) මැලවුණු (3) මුකුලිත (4) පිපුණු

★ අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල දී ඇති පදයට විරුද්ධ පදය ලියන්න.

(4) නිශ්චල - .........................

(5) පළල - .........................

(6) දොම්නස - .....................

★ අංක 07 සහ 08 ප්‍රශ්නවල පිල්ලම් පිළිවෙළට නිවැරදිව යොදා ඇති වචනය යටින් ඉරක් අඳින්න.

(7) ගැටපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල.

(1) ගෘහය (2) කුඹියා (3) කෘමියා (4) භූමිය

(8) ඇලපිල්ල, හල් ලකුණ, ගැටපිලි දෙක, හල් ලකුණ

(1) කර්තෘ (2) ශාස්තෘන් (3) කෘතිම (4) කෛලාස

★ අංක 09 සහ 10 ප්‍රශ්න යටතේ දී ඇති වචනයන් හි ස්වර හා ව්‍යංජන අක්ෂර වෙන්කර දක්වන්න.

(9) කෞතුකාගාරය - ....................................

(10) රසිකයා - ....................................

★ අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි උක්ත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(11) .................................... පාසල් වත්ත පිරිසිදු කළහ.

(1) සිසුන් (2) ශිෂ්‍යයන් (3) සිසුවෙක් (4) සිසුහු

(12) .................................... මිහිරි ගීයක් ගයන්නීය.

(1) දූරියෝ (2) දූරියන් (3) දූරියක් (4) දූරියක

(13) .................................. මිරිස් පාත්තියේ වල්පැළ ගලවා දැමුවේය.

(1) ගෙවිලිය (2) ගොවියා (3) ගොවියෙකු (4) ගෙවිලියක

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

✶ අංක 14 සිට 15 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ ඒකවචන පදය තිත් ඉර මත ලියන්න.

(14) මිනිස්සු ශබ්දය කුමක්දැයි විමසා බැලූහ. ............................................

(15) නාවිකයෝ සාර්ථකව මුහුදු ගමන් නිමා කරති. ..................................

✶ අංක 16 සහ 17 ප්‍රශ්නවල ඉරිඇඳි පදය අයත් පුරුෂය ලියන්න.

(16) ගුරුවරු කාර්යාලයට පැමිණෙති. ................................

(17) මම පන්තියට ගියෙමි. .............................

✶ අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අනුක්ත පදය ලියන්න.

(18) අපි සතුටින් නාට්‍ය බැලුවෙමු. ...........................

(19) කම්කරුවෝ මාර්ගය පිරිසිදු කරති. ........................

(20) ළමයා මල් පැළ සිටුවයි. .............................

(ලකුණු 2x20=40)

II කොටස

✶ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(1) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 ට නො අඩු රචනයක් ලියන්න.

(අ) පරිසරය ආරක්ෂා කරමු.

(ආ) මුහුදු වෙරළක සැඳෑවක්.

(ඉ) අපේ රටේ සුන්දරත්වය සුරකිමු.

(ඊ) වැඩිහිටි ඔවදන් පිළිපදිමු. (ලකුණු 20)

(02) ඔබ ගිය විනෝද චාරිකාවක් පිළිබඳ විස්තර කරමින් ඔබේ මිතුරෙකුට හෝ මිතුරියකට යවන ලිපියක් ලියන්න.

නැතහොත්

ඔබේ හොඳම මිතුරාගේ උපන්දිනයට සුබ පතමින් යවන සුබ පැතුම්පත නිර්මාණය කරන්න.

(ලකුණු 10)

(03) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සාමාන්‍ය වශයෙන් කොස් ගෙඩිය ඉදෙන්නට ප්‍රථම ගෙඩිය නෙළාගනු ලැබේ. ගෙඩියේ පැසුණු නොපැසුණු බව දැන ගනු ලබන්නේ එහි පිටතින් සියුම් සිදුරක් කොට මදුලු කැබැල්ලක් හෝ ගෙන බලාය. කොස් ගෙඩි පලු කොට කපා මදුලු වෙන් කොට ගෙන තම්බා බත් වෙනුවට කුස පුරා අනුභව කරති. ඔවුන් කොස් කන්නේ අපේ රටවාසින් 'ටර්නිප්' හෝ ගෝවා කන්නාක් මෙනි. මේ කොස් තැම්බුම රසයෙන් ද සුවඳින් ද ගෝවාවලට සමානය. පැසී ඉදුණු කල හෙවත් වැළ හෝ වරකා වූ කල සුමධුර රසයකින් යුක්ත වූ මෙය නොපිස ම කනු ලැබේ. පැසුණු කොස් ඇට පාටින් හා සුවඳින් පමණක් නොව, රසයෙන් ද අපේ රටේ 'චෙස්නට්' ගෙඩිවලට සමාන ය.

(i) කොස් ගෙඩිය නෙළා ගනු ලබන්නේ කෙසේ ද?

(ii) කොස් ගෙඩිය පැසුණු නොපැසුණු බව දැන ගන්නේ කෙසේ ද?

(iii) බත් වෙනුවට ආදේශක ආහාරය කුමක් ද?

(iv) නොපිසම කෑමට ගන්නේ මොනවා ද?

(v) චෙස්නට් ගෙඩිවලට සමාන මොනවා ද? (ලකුණු 2×5 = 10)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

(04) පහත සඳහන් ප්‍රකාශ කළේ කවුද කාටද යන්න ලියන්න.

(I) "මගේ ඉල්ලීම ගැන හිතා බැලීමයි යුතුකම"

(ii) "එහෙනම් ගිහින් හොයාගෙන වරෙල්ලා"

(iii) "ගොහින් බලාපල්ලා මගේ වී ගොඩ"

✶ පහත කවි දෙක කියවා හිස්තැනට නියමිත කවිපදය ලියන්න.

(iv) සමන් නෙළුම් හා මහනෙල් ද රෝස
මලින් නැගී ආ සුවඳින් උරා බී
හමන්නෙ මේ සීත සුළං අලුත් වූ
...............................................................

(v) ...............................................................
තමන්ට බුහුමන් ලැබෙයි එයින්නේ
අනුන්ට තම වංශය කියමින්නේ
ලබන්ට නම්බුව නොසිතාපන්නේ (ලකුණු 2x5=10)

(05) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(I) හල් කළ නොහැකි ව්‍යඤ්ජන අක්ෂර දෙකක් ලියන්න

(ii) සිංහල අක්ෂරමාලාවෙහි ඇති අක්ෂර ගණන කීය ද?

(iii) 'නරි නයිදේ රැවටිච්චි' පාඩම උපුටා ගන්නා ලද ග්‍රන්ථය කුමක් ද?

(iv) 'මැකී ගිය දඩමං' කෘතියේ පරිවර්තකයාගේ නම ලියන්න.

(v) 'අපේ ගම' කෘතියේ රචකයා කවු ද?

(vi) සචේතනික නාමපද හතරක් ලියන්න.

(vii) අචේතනික නාමපද හතරක් ලියන්න.

✶ පහත දැක්වෙන නාම පද පුරුෂලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග වශයෙන් වගුගත කරන්න.

(මයිනා, වහලය, මැහැල්ල , කමත , වැළහින්න , කොකා , නදිය , ගෙවිලිය , විදුහල්පති )

| | පුරුෂලිංග | ස්ත්‍රී ලිංග | නපුංසක ලිංග |
|---|---|---|---|
| (viii) | | | |
| (ix) | | | |
| (x) | | | |

(ලකුණු 1x10=10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk